# සත්තමො පාඨො

## සුරියො



සුරියො පභාතෙ උදෙති. සුරියස්ස බිම්බං ගොලාකාරං භවති. සො අන්ධකාරං විනාසෙති. අත්තනො රංසියො ච නිච්ඡාරෙති. සුරියෙ උග්ගච්ඡන්තෙ විහඞ්ගමා කූජන්ති. දාරකා සයනෙහි උට්ඨහන්ති. පාඨාලයං ගච්ඡන්ති. කස්සකා ඛෙත්තං ගච්ඡන්ති. බහුජනා නිජකම්මන්තෙසු නිරතා භවන්ති. සුරියාලොකං ලභිත්වා ථලාකෙසු පදුමානි විකසන්ති. පභාතෙ ච සායණ්හෙ ච ආලොකො න චණ්ඩො. සුරියො අනුදිනං අම්හාකං ආලොකං ආහරති. ආකාසෙ දිස්සමානෙසු වත්ථූසු සුරියො විසාලතමො භවති. සුරියො එකො දෙවො'ති මඤ්ඤන්ති. තස්මා ජම්බුද්වීපිකා එකච්චෙ මනුස්සා සුරියං නමන්ති. සුරියො පභාතෙ උදයාචලතො උග්ගන්ත්වා සායණ්හෙ අත්ථං ගච්ඡති. තස්මිං සමයෙ ලොකො අන්ධකාරෙ නිමුජ්ජති. අම්හාකං ආලොකං දදන්තො සුරියො මිත්තො නනු?

(පාලි රචනා 2)

**පදමාලාව**

**සුරියො** - හිරු
**පභාතෙ** - උදෑසන
**බිම්බං** - බිම්බය
**අන්ධකාරං** - අඳුර
**රංසියො** - රැස්


නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | |
|---|---|---|
| **විහඞ්ගමා** | - | කුරුල්ලෝ |
| **සයනෙහි** | - | යහන්වලින් |
| **කස්සකා** | - | ගොවියෝ |
| **නිජකම්මන්තෙසු** | - | තම කර්මාන්තවල |
| **ඵලාකෙසු** | - | විල්වල |
| **සායණ්හෙ** | - | සවස |
| **සුරියාලොකං** | - | සූර්යාලෝකය |
| **දිස්සමානෙසු වත්ථූසු** | - | පෙනෙන වස්තූන් අතරෙහි |
| **අනුදිනං** | - | දිනපතා |
| **උදයාචලතො** | - | උදය පර්වතයෙන් |
| **අත්ථං** | - | අස්තයට |
| **දදන්තා** | - | දෙන්නා වූ |

## අභ්‍යාස

**කීදිසං** - කෙබඳු　**කිං** - කුමක්　**කදා** - කවදා　**කො** - කවරෙක්
**කුතො** - කොහින්　**කත්ථ** - කොහි　**කානි** - මොනවා

1. 'සුරියො' පාඩම සිංහලට නගන්න.
2. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

උදා:- **කො පභාතෙ උදෙති? සුරියො පභාතෙ උදෙති.**

i. සුරියස්ස බිම්බං කීදිසං භවති?
ii. සුරියො කිං කරොති?
iii. සුරියෙ උග්ගච්ඡන්තෙ එතෙ කිං කරොන්ති?
    විහඞ්ගමා -
    කස්සකා -
    බහුජනා -
    දාරකා -
iv. කදා සුරියස්ස බිම්බං රත්තං භවති.
v. කදා සුරියස්ස ආලොකො න චණ්ඩො.
vi. ආකාසෙ දිස්සමානෙසු වත්ථූසු කො විසාලතමො භවති


නොමිලේ බෙදා හැරීම පිණිසයි

vii. සුරියො කුතො උග්ගච්ඡති.
viii. කදා ලොකො අන්ධකාරෙ නිමුජ්ජති.
ix. සුරියාලොකං ලභිත්වා කත්ථ කානි විකසන්ති.
x. සුරියො අම්හාකං කිං දදාති.

**ආඛ්‍යාත පද**

කිසියම් කිරීමක් හෝ වීමක් දැක්වෙන ක්‍රියාපද 'ආඛ්‍යාත' පද නමින් හැඳින්වේ. වාක්‍යයක් සම්පූර්ණවීමට ක්‍රියාපද අත්‍යවශ්‍ය වන අතර වාක්‍යයක අදහස නිරවුල්වීමට ද ක්‍රියාපදයේ අවශ්‍යතාව බලපායි.

**පුරිසො ගාමං**
**බාලකා කන්දුකෙන**
**උපාසකො යාචකස්ස දානං**
**මාතා භත්තං**
**බුද්ධො ධම්මං**

යන වාක්‍යවල ආඛ්‍යාත පදයක් දක්නට නො ලැබෙයි. එහෙයින් එම වාක්‍යවලින් අදහස සම්පූර්ණව ප්‍රකාශ නොවෙයි. එම වාක්‍යවලට ක්‍රියාපදයක් යෙදූ විට වාක්‍ය මෙන් ම අදහස ද නිරවුල් වන අයුරු බලන්න.

පුරිසො ගාමං **ගච්ඡති.**
බාලකා කන්දුකෙන **කීළන්ති.**
උපාසකො යාචකස්ස දානං **දෙති.**
මාතා භත්තං **පචති.**
බුද්ධො ධම්මං **දෙසෙති.**

ඉහත වාක්‍යවල යෙදෙන **ගච්ඡති, කීළන්ති, දෙති, පචති, දෙසෙති** යන පද **ක්‍රියා** හෙවත් **ආඛ්‍යාත** පදයි.

**ආඛ්‍යාත පද සාදා ගැනීම**

ධාතු ප්‍රකෘතියකට ආඛ්‍යාත ප්‍රත්‍යයක් එක් කිරීමෙන් ආඛ්‍යාත පදයක් සකසා ගත හැකි ය. පහත වගුව අධ්‍යයනය කරන්න.

| ධාතු ප්‍රකෘතිය | ආඛ්‍යාත ප්‍රත්‍ය | ආඛ්‍යාත පදය |
|---|---|---|
| √පච | ති | පචති (පිසයි) |
| √ලිඛ | ති | ලිඛති (ලියයි) |
| √හස | න්ති | හසන්ති (සිනාසෙති) |
| √පඨ | න්ති | පඨන්ති (පාඩම්කරති) |
| √පච | සි | පචසි (පිසහි) |
| √ලිඛ | සි | ලිඛසි (ලියහි) |
| √හස | ථ | හසථ (සිනාසෙහු) |
| √පඨ | ථ | පඨථ (පාඩම් කරහු) |
| √පච | මි | පචාමි (පිසමි) |
| √ලිඛ | මි | ලිඛාමි (ලියමි) |
| √හස | ම | හසාම (සිනාසෙමු) |
| √පඨ | ම | පඨාම (පාඩම් කරමු) |

**ආඛ්‍යාත පදයක ලක්ෂණ**

ආඛ්‍යාත පදයක ලක්ෂණ කිහිපයක් දැකිය හැකි ය.

1. කාල භේදයෙන් යුක්තවීම
2. පුරුෂ භේදයෙන් යුක්තවීම
3. කාරක භේදයෙන් යුක්තවීම
4. වචන භේදයෙන් යුක්තවීම
5. ලිංග භේදයක් නොමැතිවීම
6. ක්‍රියා අර්ථයක් ප්‍රකාශවීම

යන්තිකාලං තිපුරිසං - ක්‍රියාවාචි තිකාරකං
අත්තිලිඞ්ගං ද්විවචනං - තදාඛ්‍යාතන්ති වුච්චති.

**කාලත්‍රයක්, පුරුෂත්‍රයක්, කාරකත්‍රයක් හා වචනද්වයක් ඇති, ක්‍රියාර්ථයක් පවසන ලිංගභේදයක් නැති යමක් වේ ද එයට ආඛ්‍යාතය යැයි කියනු ලැබේ.**

පාලි භාෂාවේ ධාතු වරනැගෙන වත්තමාන, පඤ්චමී ආදි විවිධ වරනැගීම් ප්‍රභේද '**ආඛ්‍යාත විභක්ති**' නමින් හැඳින්වෙයි. ඒවා ගණනින් අටකි.

| | |
|---|---|
| 1. වත්තමානා | 5. අජ්ජතනී |
| 2. පඤ්චමී | 6. පරෝක්ඛා |
| 3. සත්තමී | 7. භවිස්සන්ති |
| 4. හීයත්තනී | 8. කාලාතිපත්ති යනුවෙනි. |

මෙයින් **වත්තමානා** (වර්තමාන) **භවිස්සන්ති** (අනාගත) ආඛ්‍යාත පළමු වසරේ දී ඉගෙන ඇත. පහත දැක්වෙන වගු හදාරන්න.

**වර්තමාන කාලය - වත්තමානා**

**ප්‍රත්‍යයමාලාව - පරස්සපද** - ති, අන්ති, සි, ථ, මි, ම
**අත්තනොපද** - තෙ, අන්තෙ, සෙ, වෙහ, එ, මෙහ

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| පුරිස | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පඨම පුරිස | පචති (පිසයි) | පචන්ති (පිසති) | පචතෙ | පචන්තෙ |
| මජ්ඣිම පුරිස | පචසි (පිසහි) | පචථ (පිසහු) | පචසෙ | පචවෙහ |
| උත්තම පුරිස | පචාමි (පිසමි) | පචාම (පිසමු) | පචෙ | පචාමෙහ |

**අනාගත කාලය - භවිස්සන්ති**

**ප්‍රත්‍යයමාලාව - පරස්සපද** - ස්සති, ස්සන්ති, ස්සසි, ස්සථ, ස්සාමි, ස්සාම
**අත්තනොපද** - ස්සතෙ, ස්සන්තෙ, ස්සසෙ, ස්සවෙහ, ස්සං, ස්සාමෙහ

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| **පුරිස** | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| **පඨම** | පචිස්සති (පිසන්නේය) | පචිස්සන්ති (පිසන්නෝය) | පචිස්සතෙ | පචිස්සන්තෙ |
| **මජ්ඣිම** | පචිස්සසි (පිසන්නෙහි) | පචිස්සථ (පිසන්නෙහු) | පචිස්සසෙ | පචිස්සවෙහ |
| **උත්තම** | පචිස්සාමි (පිසන්නෙමි) | පචිස්සාම (පිසන්නෙමු) | පචිස්සං | පචිස්සාමෙහ |

වර්තමානකාලික ක්‍රියා අර්ථය පැවසීම සඳහා **වත්තමානා** ආඛ්‍යාතය භාවිත වන අතර අනාගතකාලික ක්‍රියාර්ථය පැවසීමට **භවිස්සන්ති** ආඛ්‍යාතය යොදා ගැනේ. පහත දැක්වෙන වාක්‍ය දෙස බලන්න.

| වත්තමාන | භවිස්සන්ති |
|---|---|
| පුරිසො ගාමං ගච්ඡති. | පුරිසො ගාමං ගච්ඡිස්සති. |
| බාලකා අක්ඛරානි ලිඛන්ති. | බාලකා අක්ඛරානි ලිඛිස්සන්ති. |
| ත්වං නගරං ගච්ඡසි. | ත්වං නගරං ගච්ඡිස්සසි. |
| තුම්හෙ පරිවෙණං ගච්ඡථ. | තුම්හෙ පරිවෙණං ගච්ඡිස්සථ. |
| අහං ධම්මං සුණාමි. | අහං ධම්මං සුණිස්සාමි. |
| මයං සුරියං වන්දාම. | මයං සුරියං වන්දිස්සාම. |

ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයන් පරස්සපද හා අත්තනොපද වශයෙන් දෙපරිදි වේ. ක්‍රියාවෙන් උපන් ඵලය තමා වෙත නොපැමිණ අනෙකෙකු කෙරෙහි පැවතියේ නම් එය පරස්සපදයයි. ක්‍රියා ඵලය තමා වෙත පිහිටියේ නම් ඒ අත්තනොපදයයි. මෙම පාඩමේදී අත්තනොපදය වාචෝද්ගත කිරීම සඳහා පමණක් භාවිත වන අතර වාක්‍ය පරිවර්තනයේ දී හා වාක්‍ය නිර්මාණයේ දී පරස්සපදය පමණක් භාවිත කරමු. පහත දැක්වෙන වගු අධ්‍යයනය කරන්න.

## වත්තමානා පරස්සපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පචති | පචන්ති | පචසි | පචථ | පචාමි | පචාම |
| ගච්ඡති | ගච්ඡන්ති | ගච්ඡසි | ගච්ඡථ | ගච්ඡාමි | ගච්ඡාම |
| ධාවති | ධාවන්ති | ධාවසි | ධාවථ | ධාවාමි | ධාවාම |
| ඛාදති | ඛාදන්ති | ඛාදසි | ඛාදථ | ඛාදාමි | ඛාදාම |
| වන්දති | වන්දන්ති | වන්දසි | වන්දථ | වන්දාමි | වන්දාම |

## වත්තමානා අත්තනොපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පචතෙ | පචන්තෙ | පචසෙ | පචව්හෙ | පචෙ | පචාමහෙ |
| ගච්ඡතෙ | ගච්ඡන්තෙ | ගච්ඡසෙ | ගච්ඡව්හෙ | ගච්ඡෙ | ගච්ඡාමහෙ |
| ධාවතෙ | ධාවන්තෙ | ධාවසෙ | ධාවව්හෙ | ධාවෙ | ධාවාමහෙ |
| ඛාදතෙ | ඛාදන්තෙ | ඛාදසෙ | ඛාදව්හෙ | ඛාදෙ | ඛාදාමහෙ |
| වන්දතෙ | වන්දන්තෙ | වන්දසෙ | වන්දව්හෙ | වන්දෙ | වන්දාමහෙ |

## භවිස්සන්ති පරස්සපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පචිස්සති | පචිස්සන්ති | පචිස්සසි | පචිස්සථ | පචිස්සාමි | පචිස්සාම |
| ගච්ඡිස්සති | ගච්ඡිස්සන්ති | ගච්ඡිස්සසි | ගච්ඡිස්සථ | ගච්ඡිස්සාමි | ගච්ඡිස්සාම |
| ධාවිස්සති | ධාවිස්සන්ති | ධාවිස්සසි | ධාවිස්සථ | ධාවිස්සාමි | ධාවිස්සාම |
| ඛාදිස්සති | ඛාදිස්සන්ති | ඛාදිස්සසි | ඛාදිස්සථ | ඛාදිස්සාමි | ඛාදිස්සාම |
| වන්දිස්සති | වන්දිස්සන්ති | වන්දිස්සසි | වන්දිස්සථ | වන්දිස්සාමි | වන්දිස්සාම |

### හවිස්සන්ති අත්තනොපද

| පඨම පුරිස | | මජ්ඣිම පුරිස | | උත්තම පුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පචිස්සතෙ | පචිස්සන්තෙ | පචිස්සසෙ | පචිස්සව්හෙ | පචිස්සං | පචිස්සාමෙහ |
| ගච්ඡිස්සතෙ | ගච්ඡිස්සන්තෙ | ගච්ඡිස්සසෙ | ගච්ඡිස්සව්හෙ | ගච්ඡිස්සං | ගච්ඡිස්සාමෙහ |
| ධාවිස්සතෙ | ධාවිස්සන්තෙ | ධාවිස්සසෙ | ධාවිස්සව්හෙ | ධාවිස්සං | ධාවිස්සාමෙහ |
| ඛාදිස්සතෙ | ඛාදිස්සන්තෙ | ඛාදිස්සසෙ | ඛාදිස්සව්හෙ | ඛාදිස්සං | ඛාදිස්සාමෙහ |
| වන්දිස්සතෙ | වන්දිස්සන්තෙ | වන්දිස්සසෙ | වන්දිස්සව්හෙ | වන්දිස්සං | වන්දිස්සාමෙහ |

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. ආඛ්‍යාත පදයක් යනු කුමක් ද?
ii. ආඛ්‍යාත පදයක් සාදාගන්නා ආකාරය පෙන්වා දෙන්න.
iii. ආඛ්‍යාත පදයක ලක්ෂණ දැක්වෙන ගාථා පාඨය ලියන්න.
iv. ආඛ්‍යාත විභක්ති අට ලියා දක්වන්න.
v. වත්තමානා, හවිස්සන්ති ආඛ්‍යාත විභක්තීන්හි ප්‍රත්‍යයමාලා වගුගත කරන්න.

2. 'සුරියො' ඡේදයේ ඇති ආඛ්‍යාත පද උපුටා එකවචන බහුවචන වශයෙන් වෙන් කරන්න.

3. 'සුරියො' ඡේදයේ දැක්වෙන 'වත්තමාන' ආඛ්‍යාත පදවල හවිස්සන්ති ආඛ්‍යාත රූප ලියා දක්වන්න.

4. √ලභ ධාතුව හා √භූ ධාතුව 'වත්තමානා' 'හවිස්සන්ති' ආඛ්‍යාත විභක්තිවල වරනගා තේරුම ද සහිත ව වගුගත කරන්න.

5. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. පුත්තො ධම්මං උග්ගණ්හාති.
ii. ගොපාලො ගොණෙ වික්කිණිස්සන්ති.
iii. දාසා මිත්තානං සුනඛෙ හරන්ති.
iv. චොරා මනුස්සානං අස්සෙ චොරෙස්සන්ති.
v. වාණිජස්ස පුත්තා අජෙ වික්කිණන්ති.

6. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. මිත්‍රයෝ සිංහයන් බලති.
ii. ගොවියෝ ගොනුන් මිලට ගනිති.
iii. ඔබ පහන් දල්වහි.
iv. සිංහයා මුවෙකු මරන්නේය.
v. අපි දිවයින රකින්නෙමු.

**දීඝො බාලානං සංසාරො, සද්ධම්මං අවිජානතං**

**සද්ධර්මය නොදන්නා වූ බාලයන්ට සංසාරය දිගය.**

**(ධම්මපදපාළි, බාලවග්ග, 1 ගාථාව)**